

මෙතෙක් කතාව

බිඳෙන් බිඳ තම හදවතේ හෙලිදරව් වෙමින් පවතින ආදරයේ හිමිකාරිය වන ටාන්‍යා සොයා ලහිරු නැවත වරක් පර්ත් පැමිණියේද, ඈ පිළිබඳව මහේල තුළද අදහසක් ඇති බව දැනගැනීමෙන් නොසන්සුන් බවට පත්වේ. ඒ අතර තුලදී එළඹෙන උපාධි ප්‍රධානෝත්සවය සඳහා ලෝගුව ලබා ගැනීමේ අරමුණින් දෙමව්පියන් සමග විශ්ව විද්‍යාලයට යන ඔහුට බලාපොරෙත්තු නොවන අන්දමින් ටාන්‍යා හමුවේ.

අද එතැන් සිට....

''ටාන්‍යා....''

එසේ කියන ගමන් මම පෝලිමෙන් ඉවත්වී ඈ සිටින දෙසට ඇවිද ගියෙමි. සැතපුම් දහස් ගණනක් දුර මා පැමිණියේ මේ දසුන දැක්මේ බලාපොරොත්තුවෙනි. මගේ හඬ පිටවනවාත් සමඟම තිගැස්සී ගිය ඇය හැරී බැලුවේ පුදුමයත් සමගය. මොහොතක් හෝ ප්‍රමාදයක් නොපෙන්වූ ඈ මා වෙතට ආවේ මට සුභපතමිනි.

''ලහිරු....., කන්ග්‍රැජුලේෂන්''

මම සුරත දිගුකරමින් ඈටද සුභ පැතුවෙමි. එහෙත් ඈ මගේ දිගුකළ අත පිළිගත්තේ නැත. ඒ වෙනුවට ඈ දෑතින්ම මා වැළඳගෙන නැවත නැවතත් මට සුභපතන්නට විය. ඈ සිටියේ උතුරායන සතුටකිනි. මා තුළද මතුව තිබුණේ කිසිදවසක නොතිබුණු අන්දමේ සතුටකි. මා අම්මා දෙසට හැරුණේ ටාන්‍යාව ඇයට හඳුන්වාදෙන බලාපොරොත්තුවෙනි.

''ටාන්‍යා මේ මගේ අම්ම......''
''හලෝ.....''

අම්මා ඈ වෙතට දිගුකළ අතද පිළිගන්නවා වෙනුවට ටාන්‍යා ඈ වැළඳගෙන ඇගේ මුහුණ සිපගත්තාය. අම්මාද පෙරළා ඈ සිපගත්තේ ඈට සුභ පතන ගමන්ය. ඒ දසුන හාස්‍යයක් නොවූයේ එසේ සුභපැතුම් හුවමාරු කරගන්නා පිරිස අප අතර එමට වූ බැවිනි. ටාන්‍යා මා ද අම්මාද අතරට මැදිවිය. ඔවුන් දෙදෙනා මාද නොතකා කතාබහේ යෙදුනේ කාලයක සිට දැන හඳුනාගෙන සිටි මිතුරියන් දෙදෙනෙකු පරිද්දෙනි. මට ඇගෙන් ඇසීමට ඈ සමග කතාකිරීමට බොහෝ දෑ විය. එහෙත් ඒ කිසිවක් මට ඒ මොහොතේ සිහිපත් වූයේ නැත.

ටාන්‍යා අම්මාට කතාකරන අතර ද මාද ඊට සම්බන්ධකර ගැනීමට නිතර උත්සාහ ගත්තාය.

''මම මහේලටත් කතා කළා එන්න මෙතෙන්ට. ඒත් එයා කැන්ටිමේ නැවතුනා...'' එසේ කියූ ඇගේ මුහුණේ වෙනසක් ඇත්දැයි මම ඕනෑකමින් බැලුවෙමි. එහෙත් එහි එවැනි කිසිවක් වූයේ නැත. ආපසු ගෙදර යනවා වෙනුවට ටාන්‍යාගේ ඉල්ලීමට අප කැන්ටිමට ගොස් මහේල මුණගැසුනෙමු.

''අද රෑ උත්සවයෙන් පස්සේ අපිත් එක්ක හිටිය කට්ටියට පාටියක් ලැහැස්ති කරල තියෙන්නෙ, ලහිරුත් එනව නේද..? මහේල තමයි ඒකට මුල් උනේ....'' ඒ කීවේ ටාන්‍යාය. මම පුදුම වුනෙමි. ඒ ආරාධනාව මට කළ යුතුව තිබුණේ මහේල මිස ටාන්‍යා නොවේ. මා කිසිවක් කියන්නට ගියේ නැත. එහෙත් අම්මා මා වෙනුවෙන් කතා කළාය.
''පුතා යාළුවොත් එක්ක ඔයා යන්න. නේද රිචඩ්..... අපි හෙට අන්කල්ලත් එක්ක රෑ කෑමකට පිටට යමු. ටාන්‍යාත්, මහේලත් එන්න අපිත් එක්ක හෙට''

ටාන්‍යා එය පිළිගත්තේ ඉතා සතුටිනි. එහෙත් මහේල හරි පිළිතුරක් දුන්නේ නැත. මහේලත්, මාත් එකිනෙකාගේ සිතැඟි තේරුම්ගෙන සිටි අතර පිරිස මැද එය වසන් කරන්නට උත්සාහගන්නා බව මට වැටහිනි.
....
එදින රාත්‍රියේ උපාධි ප්‍රධානෝත්සවය ඉතා ප්‍රීතිමත් සහ ගාම්භීර අයුරකින් නිමවුනා යැයි මම සිතුවෙමි. මහේලද පැමිණ සිටියේය. ටාන්‍යත් මාත් සාදය පැවැත්වෙන තැනට හැරලූ දෙමාපියන් රාත්‍රී කෑම සඳහා පිටත්ව ගියේ එකම තැනකටය. ටාන්‍යාගේ මවත් මගේ මවත් ඉතා කුළුපග යෙහෙලියන් බවට ඒ එක රැයින් පත්ව තිබිණි. ඊට ටාන්‍යාද හේතුවූවා යැයි මට සිතිනි. මහේල මටද ටාන්‍යාටද ඔහු සමග ඔහුගේ වාහනයෙන්ම උත්සවය පැවැත්වෙන තැනට යාමට ආරාධනා කළ ද පසුව ඔහු සමග පිටත් වූයේ වෙනත් සිසුන් කිහිපදෙනෙකි.

මට උවමනාවූයේ ඒ මුලු සාදය පුරාම ටාන්‍යා අසල සිට ඈ සමඟ කතාබහේ යෙදීමටය. නමුත් එක සුළු මොහොතකට හෝ අප දෙදෙනා තනි නොකිරීමට මහේල සැලකිලිමත් විය. මට ඔහු ගැන තරහක් හිතට නැඟුණද ටාන්‍යා ඉදිරිපිට ඔහුට දොස් නැඟීම හෝ ඔහු නොරුස්සනා බවක් පෙන්වීම හැදුණු තරුණයෙකුගේ ගතියක් නොවේ යැයි සිත කියූ බැවින් නිහඬව සිටියෙමි.

ජීවිතයේ චමත්කාරයක් ලස්සනත් පමණක්ම හැඟීයන අයුරින් ගෙවීයන ඒ රැයේ දෙලොවක් අතර සිතිවිලිවලට මැදිවී සිටියේ මා පමණක්ද යන්න මට වරින් වර සිත්විය. ටාන්‍යා අද ඉතා සුන්දරව පෙනේ යැයි මට සිතිනි. ඇගේ කොණ්ඩය මුල්වරට සකස් කර තිබෙනවා මම දුටුවේ අදය. තද නිල් පැහැති විලුඹ තෙක් දිගුවන චාම් සරල ගවුමක් ඈ හැඳ සිටියාය. කුඩා නිල් පැහැති කරාබු යුවලක් ඇගේ එකම ආභරණය විය. අතේ හෝ කරේ කිසිවක් පැළඳ නොසිටි ඇය ඒ නිසාම සුන්දරයැයි මට සිතිනි.

''ටාන්‍යා එන්න මාත් එක්ක නටන්න''

මහේලගෙන් ඒ ඇරයුම ටාන්‍යාට යොමුවූයේ මා බලාපොරොත්තු නොවුනු මොහොතකය. ඔහුගේ ආරාධනාව පිළිගෙන නැඟී සිටීමට පෙර ටාන්‍යා මා දෙස වරක් බලනවා මට මතකය. ''....... ලහිරු.... මට ආරාධනා කළේ නැත්තේ ඇයි.... මේ ආරාධනයට වඩා සතුටින් මම ඔයාගෙ ආරාධනාව පිළිගන්නව නේද එහෙනම්....'' යි යන පණිවිඩයක් ඒ දෑස තුළ විනි යැයි මට සිතුනි. ශාලාව මැද මහේලගේ දෑතට මැදිව රංගනයේ යෙදෙමින් සිටියද ඈ නොකඩවාම මා දෙස බලනවා මම දිටිමි.... ඇගේ ඒ සෑම බැල්මක්ම මා හදවත විනිවිද ගියේය... ආදරයේ සංවේදනාත්මක හැඟීම තුළ වූ මායාකාරී බලය කොතරම්දැයි මම ඒ මොහොතේ වටහාගෙන සිටියෙමි... මා අවට මා සමග ගැවසෙමින් සිටි පිරිස කිසි-වෙක්ම මම ඒ මොහොතේ දුටුවේ නැත. හදවතින් සිටියේ ඈ සමග රැඟුම් භූමිය තුළය. මගේ දෑතට මැදිව සිටි ඒ සිරුරේ ස්පර්ශය ඇඟිලි තුඩු විනිවිදව ශරීරය පුරා දිවයන්නාක් සේ මට දැනී ගියේය. ඇගේ සුසුම්වල උණුසුම පවා මගේ හදවතට දැනිනි. ප්‍රීතියෙන් ඉපිලෙමින් තිබූ ඒ පියකරු මුහුණ එකවරක් හෝ සිපගන්නට ඇත්නම් යි යන හැඟීමෙන් මා හදවත පෙලෙන්නට විය.

ඇයත් මාත් මැදිකරගනමින් මගේ හදවත තුළ නොකඩවා මතුව එමින් තිබූ සිතිවිලි කෙසේ කොයි ආකාරයකට විග්‍රහ කළ හැකිදැයි මම නොදැන සිටියෙමි. මා දැන සිටියේ ඒ තුළ වන අවංක බව පමණකි. මා යුවතියන් සමග නටා ඇති වාර බොහොමයකි. ඒ සියල්ල මවෙත රැගෙන ආවේ සතුටක්, සැහැල්ලුවක්, විනෝදයක් පමණි. ඒ කිසිම යුවතියක් සමග රැඟුම් භූමිය මැදට යාමට මට කිසිම ආක-ාරයක චකිතයක් කිසිදිනෙක දැනුනේ නැත. නමුත් අද මගේ දෙපා අඩපණවී අත්තාක් මෙන් මට දැනේ. ටාන්‍යා සමහර විට බලාපොරොත්තුව සිටියේ මා පැමිණ ඈ සමග නැටීමට ඉල්ලා සිටිනතෙක් විය හැකිය. එහෙත් ඒ සිතුවිල්ල ක්‍රියාත්මක කිරීමේ අංශුමාත්‍ර වූ හෝ ආත්මශක්තියක් මා වෙත ඒ මොහොතේ පැවතියේ නැත. මා ඇයව දුටුවේ අත තැබීමටත් අවසර ඉල්ලා සිටිය යුතු වූ පූජා වස්තුවක් පරිද්දෙනි.

මහේල වරින්වර ටාන්‍යාව කතාවට එක්කර ගැනීමට උත්සාහ ගන්නවා මම දිටිමි. ඇය මහේල වෙත දෙනෙත් ඔසවන සෑම මො-හොතක්ම මා හදවත වේදනාවට පත්කළේය. ඒ සෑම වේදනාවක්ම අතීතයේ ටාන්‍යාද මාද මැදිකරගත් සිදුවීම්වල දී මම ක්‍රියාකළ ආකාරයේ අඩුපාඩු පිළිබඳව අසාධාරණ නොවන තක්සේරු-වක් මගේ සිතට ඇතුළු කරවන ලදී. මේ තාක් මම සිදුකර තිබුණේ මා පිළිබඳව අවංකවම සැලකිල්ලක් දැක්වූ ඇගේ සිත තලා පෙලා දැමීමය. එහෙත් මින් ඉදිරියට එසේ නො-වන්නෙමියි සිත කියයි. ඒ සියලු වැරදි වෙනුවට මගේ හදවතේ අවංකවම ඈ වෙනුවෙන් මතුවී තිබෙන ආදරය ඇයට පුදකරනවා යැයි මම සිතාගතිමි. මගේ අසරණ හදවත ආදරයේ සියලු පරිත්‍යාගන් වෙනුවෙන් ඒ මොහොතේ සැදී පැහැදී සිටියේය. එය මුළුමනින්ම පිරී පැවතියේ පුදකිරීමේ අරමුණුවලින් විනා ඉල්ලා සිටීමේ අරමුණුවලින් නොවුණි.

ටාන්‍යා වෙතට ගොස් මගේ සිතැඟි නොසඟවා පවසනවාය යන අරමුණින් මම නැඟී සිටියෙමි. එහෙත් මේ වනවිට කලින් වාදනය වෙමින් පැවති සංගීත වාදනයේ වෙනසක් ඇතිවිය. මා බලාපොරොත්තු නොවූ මා නොදැන සිටි කිසිවකට පසුබිම ඒ වන විට සකස් වෙමින්

තිබිණි. මා හුන් තැනම නැවතුනේ මගේ හදවත ගල්වී ගිය බැවිනි. මහේල විසින් ටාන්‍යාට යෝජනාවක් ගෙන එන ලදී. ඔහු මේ සියල්ල කලින් සැලසුම් කර තිබුණා විය යුතුය. මේ සාදයද ඒ සැලසුමේම කොටසක් බව පැහැදිළිය. ටාන්‍යා එක්වරම බැලුවේ මා දෙසය. මම ඒ බැල්මට හසු නොවී බිම බලාගතිමි. මා වෙතට ඒ මොහොතේ ඇතුළුවී තිබූ හැඟීම කුමන ආක-ාරයේ දුකකට සමාන කරන්නදැයි මා වෙත හැඟීමක් නොවුනි. මම ජීවිතයේ කිසිදිනෙක හඬා ඇති බවක් මට මතක නැත. හිමිකර ගැනීමට සිතා අහිමිවී ගිය කිසිවක් පිළිබඳවද මට මතක තිබුණේ නත. මගේ වරදින්, මගේ ප්‍රමාදයෙන් මේ සියල්ල මෙසේ සිදුවී තිබේ යැයි යන වරදකාරී හැඟීම මා සිතට වදදෙමින් පැවතිනි. බලාපොරොත්තු නොවන ව්‍යසනයකට වැඩිහිටි කිසිවෙකුගේ රැකවරණයෙන් තොරව තනිවම මුහුණදෙන කුඩා දරුවෙකු හැඟීම් විරහිතව ඒ ව්‍යසනය තමා ගිලගන්නා තෙක් බලා සිටිනවා වැනි වූහැඟීකින් යුතුව මම ඔවුන් දෙස බලා සිටියෙමි.

සිසුන් සියල්ල ඔවුන් වටා එක් රොක්වනු මා බලාගෙනය. ටාන්‍යාගේ නෙත් තවවරක් මා සො-යමින් වෙහෙසෙන්නට ඇත. එසේත් නොමැතිනම් මා ඇගේ හදවතින් සම්පූර්ණයෙන්ම මකා දමන්නට ඇත... කාලයක් තිස්සේ මම මේ හදවත රිදවූවෙමි. එහෙව් නපුරෙක්වූ මම අද ඒ හදවත වෙනුවෙන් කුමන අයිතිවාසිකමක් දක්-වන්නද....? ඔවුන් වටා එක් රොක්වී සිටින සිසුන් ''ඔව්'' යැයි ඇය ලවා කියවන්නට බලවත් උත්සාහයක යෙදෙනවා මට පෙනිනි. ඒ ගෝසාව ඔල්වරසන් දීමකින් අවසන් විය. ඈ මහේල පිළිගැන්වූ මුදුව පිළිගෙන තිබුණාය. මට තවත් ඒ දෙනෙත් බැල්මට හසුවීමට උවමනාවක් නොවීය.

මම ශාලාවෙන් පිටඋනෙමි. වෛවර්ණ ආලෝක ධාරා රාශියකට මැදිව සිටි මම දොරටුව අසලදී ගිලගත් අන්ධකාරය මා තැතිගැන්වීය. මගේ දෙනෙත් තෙත්වී තිබෙනවා මට දැනුනි. ගොඩනැගල්ලෙන් ඉවත්වූ මම තණබිස්ස අසල තිබූ ලී බංකුව මත වාඩිඋනෙමි. මා සිටියේ ගොඩනැගිල්ලට පිටුපා වීම ගැන මම සතුටුවීමි. ඒ දෙසට යොමු වී තිබුණේ මද එළියකි. රෑ මැදියමද පසුවී ඇති බව අත තිබූ ඔරලෝසුවෙන් මම තේරුම් ගතිමි. අඳුර මැදින් ශාලාව දෙසින් ගලා ආ සිහින් සංගීත රාවයට ඇහුම්කන් නොදීමට මම උත්සාහ ගතිමි. ඒ වෙනුවට තණබිස්සට මදක් ඈතින් පාරේ යමින් එමින් තිබූ රථවාහන දෙසට මම දෙනෙත් යොමු කරගෙන සිටියෙමි. මීට පැය ගණනාවකට කලින් මගේ සිත් සතන් පිරී පැවති සතුට මට මතකය. මේ ගමන මම නොපැමිණියා නම් මීට වඩා හොඳ යැයි සිත කියයි. නමුත් දැන් සියල්ල සිදුවී හමරාය. කිසි දවසක ජීවිතය තුළ අත්විඳ නොතිබුණු හුදකලාවකට හදවත බාරකර මම නැඟීසිටියෙමි......

ටයි පටිය ගලවා අතට ගත් මම කමිස බොත්තම් කිහිපයක් විවරකර දැමුවෙමි. කබාය උරහිස මත එල්ලාගත් මම ගලින් ගල අතුරා පිළියෙල කර තිබෙන අඩිපාර ඔස්සේ නොගොස් තණබිස්ස හරහා මින් ඉවත්ව යමියි සිතාගත්තෙමි. මේ මනස්ගාත ඇඳුම මට මහා වධයක් යැයි සිතට දැනේනට විය. මේ විචිත්‍ර පරිසරයට මම අයිති නැති තැනැත්තෙකු යයි හැඟීමක් මට ඇතිවිය. රෝස මල්ගොමු වෙතින් මා වෙත ගලා ආ මල් සුවඳ මා පීඩාවට පත්කළේය. අඩිපාර හරහා පියවර කිහිපයක් ඉදිරියට තැබූ මම අඩිපාරත් තණබිස්සත් වෙන්කරමින් රෝපණය කර තිබෙන පෙටූනියා මල් පඳුරු ගොන්න දෙස මොහොතක් නැවතී බලා සිටියෙමි. ඒ සියුමැලි මල් පෙති මත වතුර බිඳු දිලිසෙමින් තිබිණි. මගේ ගමන් මඟ හරස්කරගෙන සිටින ඒ මල් පඳුරු පෑගීමේ චේතනාවක් මා වෙත ඇති වුයේ නැත. මගේ පියවර මත සිය ඉරණම තීරණය වී ඇති බව දැන දැනත් කිසිවක් කරකියාගත නොහී අන්ත අසරණවූ හැඟීමෙන් යුතුව ඒ මල් පඳුරු මා දෙස බලා සිටින බවක් මට දැනේනට විය. මා වෙත පවතින අසරණකම මීටත් වැඩි නොවී දැයි මට මොහොතකට සිතිනි.....

ඒ වන විට තණබිස්ස පැවතියේද තෙත බරිතවය. මල් පඳුරුත් තණබිස්සත් වෙනුවෙන් වූ ස්වයංක්‍රීය වතුර මල් ක්‍රියාත්මකවී වැඩි වේලාවක් නොවේ යැයි මට සිතුනි. හදිසියේ සිතට නැඟී ආ අදහසකට අනුව පහත් වී මම දෙපයේ වූ සපත්තුද මේස්ද ගලවා අතට ගතිමි. මල් පඳුරු නොතැලෙන සේ සීරුවෙන් දෙපාතබා තණපිඩලි මතට ගොඩවුනෙමි. දෙපාවලට දැනුනු තෙත් බව මා සිතට විශේෂ හැඟීමක් මතුකර දුන්නේ නැත. ''මට පිස්සු හැදීගෙන එනවාදැ''යි මට සිතුනි......

මහපාරට ගොඩවූ මම පාර අයිනේ ටික දුරක් ඇවිද ගියෙමි. මට හුරුපුරුදු මේ නගරයේ ගොඩනැගිලි සියල්ල විසින් මා ප්‍රතික්ෂේප කරදමනු ලැබ තිබේ යැයි මට සිතේ. පාර අද්දරට වන්නට මදක් උඩට මතුවී තිබූ ගලක හැපීගිය කකුලේ ඇඟිලි පොකුරම එක දිගටම ඇඳුම්කමින් පැවතිනි. කුලී රථයකට ගොඩවීමේ අරමුණින් මාර්ගය හස්කිරීමට අවස්ථාව ලැබෙනතෙක් මංසන්ධියේ වූ මාර්ග සංඥා කුළුණට මම වාරුවීමි. මා අසලට වන්න නැවතුනු සුදු යුවතිය කෙරෙන් මත් ගඳ වහනය විය. මම හැරී බැලුවෙමි. ඇගේ සුරත මත ඒ වනවිටත් විවරවුනු මධ්‍යසාර බෝතලයක් රැඳී තිබිණි. එක තැනක සිටගෙන සිටීමට නොහැකිව ඇය ඒ මේ අත වැනෙමින් සිටියේය. ඇගේ පාවහන් යුවල රැඳී තිබුණේ ඇගේ පෙම්වතා අත විය හැකිය. ඒ පාවහන් යුවලේ අඩිය අඟල් දෙක තුනක් පමණ උස යැයි මට සිතුනි. මා ඒ දෙස බලනවා දුටු ඔහු.....''සුභ සන්ධ්‍යාවක් සර්'' යැයි පැසුවේ සුහද බවක් පළකරමිනි.
මාද සිටියේ වෙරිමතින් යැයි ඔහු අනුමාන කරන්නට ඇත. ඔහුගේ පෙම්වතියත් මාත් අතරවන එකම වෙනස නම් මම විසිනොවී එකතැන සිටගෙන සිටීම පමණය.
''සුභ සන්ධ්‍යාවක්''
යැයි මමද ඔහුට පෙරළා සුභ පැතුවෙමි.

ලබන කලාපයට